# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

நிதி, பொருளாதார அபிவிருத்தி, கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு

MINISTRY OF FINANCE, ECONOMIC DEVELOPMENT, POLICY FORMULATION, PLANNING AND TOURISM

ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො.191, ධර්මපාල මාවත, කොළඹ 07 | ஜே ஆர் ஜெயவர்தன மையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7

J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07


| මාගේ අංකය / எனது இல / My No. | WBB/Notice/D/Div/2024 | ඔබගේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2024.11.18 |
|---|---|---|---|---|---|

Circular No - 24/2024

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස් වරුන්,

**අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය දෙවන වටයේ අයදුම්පත් කැඳවීම සඳහා අතිරේක සහන කාලයක් ලබා දීම**

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ දෙවන වටය සඳහා අයදුම්පත් කැඳවනු ලදුව දැනට අයදුම්පත් 455,000 ක් පමණ ඉදිරිපත්ව ඇත. මෙතෙක් පළමු වටයේ හා දෙවන වටයේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොහැකිවූ තැනැත්තන් සිටී නම් එම තැනැත්තන්ට අවස්ථාව ලබාදීම සඳහා තව දුරටත් අතිරේක සහන කාලයක් ලබාදීමට රජය තීරණය කර ඇත.

ඒ අනුව 2024.11.25 දින සිට 2024.12.02 දින දක්වා කාලය තුළ මෙතෙක් අයදුම්පත් ඉදිරිපත් නොකළ තැනැත්තන්ට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. ඒ සඳහා කලින් දෙවන වටය සඳහා හඳුන්වා දුන් ආකෘති පත්‍රයම භාවිතා කළ යුතු අතර අවශ්‍ය අයදුම්පත් මුද්‍රණය කර අවශ්‍ය පුද්ගලයින් වෙත සුදුසු ක්‍රමවේදයක් යටතේ නිකුත් කිරීමට ඔබ විසින් පියවර ගත යුතුය.

එම අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඇත්ද යන්න පරීක්ෂාකර භාර ගැනීමටත් එම අයදුම්පතේ අග කොටසේ ඇති රිසිට් පත සම්පූර්ණ කර අයදුම්කරුට නිකුත් කිරීමටත් ඔබේ අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදීමට කටයුතු කරන මෙන් දන්වමි. එම අයදුම්පත්වල තොරතුරු IWMS පද්ධතියට ඇතුළත් කිරීමටද මෙම අදාළ කාලය තුළ දී පියවර ගත යුතුවේ.

මීට පෙර භාරගෙන තිබූ නමුත් පද්ධතියට ඇතුළත් නොකළ අයදුම්පත් වේ නම් මෙම කාලය තුළදී ඒවා ද පද්ධතියට ඇතුළත් කිරීමට පියවර ගත යුතුවේ. 2024 දෙසැම්බර් මස තුළදී දෙවන වටයේ අයදුම්පත් වලට අදාළව සංගණන ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිත බැවින් දෙසැම්බර් 02 වන විට මෙම කටයුතු අවසන් කිරීම අවශ්‍ය වේ.

වතු ප්‍රදේශවලට අයත් නිවාස වල (ලයින් කාමර) වාසය කරන පවුල් සම්බන්ධයෙන් සැලකිල්ලට ගත් විට ඉඩ පහසුකම් නොමැති වීමේ හේතුවෙන් පවුල් වැඩි ගණනක් වාසය කරන අවස්ථා ඇත. එකට ඉවුම්පිහුම් කරන එකට වියහියදම් දරන සාමාජිකයින් සහිත පවුලක් යන්න වෙනුවට එවැනි වතු නිවාස වල පවුල් සම්බන්ධයෙන් වෙන් වෙන් පවුල් වශයෙන් සඳහා අයදුම්කිරීමට අවස්ථාව ලබා දිය යුතු බවට අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා දී ඇත. එබැවින් එම කරුණ වතු නිවාස සම්බන්ධයෙන් පමණක් සැලකිල්ලට ගත යුතුයි.


කාර්යාලය / அலுவலகம் | Tel: 009411-2151481, 009411-2484600/4117 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் | welfarebenefitboard2016@gmail.com | වෙබ් අඩවිය / இணையதளம் | www.wbb.gov.lk

එවැනි පවුල් දැනටමත් දෙවන වටය සඳහා එක් පවුලක් ලෙස අයදුම් කර ඇත්නම් නිවැරදි ලෙස නව අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදිය යුතුයි. එවැනි අයදුම්පත් පරිගණක ගත කිරීමේදී මුල් අයදුම්පත අවලංගු කර නව අයදුම්පත් ඇතුළත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මගින් ජාතික මාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරයක් ලබාදීමට පියවර ගන්නා අතර ප්‍රාදේශීය වශයෙන් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා මෙන්ද දන්වමි.

ලිපිද්‍රව්‍ය වියදම් සඳහා ලබා දී ඇති මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ නම් ඉදිරියේදී ප්‍රතිපාදන ලබාදීමට පියවර ගනු ලැබේ.

මේ සම්බන්ධයෙන් ඔබ විසින් ලබා දෙන සහාය අගය කරමි.

ජයන්ත විජේරත්න
සභාපති/කොමසාරිස්

පිටපත් : 01. ලේකම්, මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන සැලසුම් හා සංචාරක අමාත්‍යාංශය

02. ලේකම්, අධිකරණ, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය

03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස් වරුන් - අවශ්‍ය සම්බන්ධීකරණ ය හා මෙහෙයුම් කටයුතු සඳහා